ඕපාත ප්‍රදේශයේ නිවසකට, ශාන්තිකර්මයක් සඳහා යැයි කියා ගෙන්වාගත් පුද්ගලයෙකු, එම නිවසේ බාලවයස්කාර දැරියකට ලිංගික අපයෝජනයක් සිදු කිරීම සම්බන්ධ පුවතක්, ලංකාදීප සහ අරුණ පුවත්පත් (පෙබ. 07, 2023) සිරස්තල තුළ පළ වී තිබුණේ මෙසේයි.

* "සැමියාගේ අපලය දුරුකරගන්න බිරිඳ ගෙට ගෙන්වාගත් කපුවා, දුවට ලොකුම අපලය කර පනී" - ලංකාදීප
* "ගෙහිමියාගේ බේබදුකම නතරකරන්න ශාන්තිකර්මයට ආ කට්ටඩියා, අමුතු තොවිලයක් නටලා" - අරුණ

බාලවයස් ලිංගික අපයෝජනයක් යනු නීතියට අනුව අපරාධයකි. එසේම පොදුවේ මෙවැනි අපරාධ සමාජ ගැටළුවක් ලෙසින් ද හඳුනාගත හැකියි. එවැනි සිදුවීම් පිළිබඳ වාර්තා කිරීමේදී, ලිංගික අපයෝජනයක සැබෑ බරපතල භාවය ඉදිරිපත් කිරීම ද මාධ්‍ය වගකීමක් නොවේදැයි පාඨක අප විමසිය යුතුයි.

1) මෙම සිරස්තල ඔස්සේ, ලිංගික අපයෝජනයක්, "අමුතු තොවිලයක්" නැටීමක්, "ලොකුම අපලය" කිරීමක් ලෙසින් දැක්වීම, එම වරද සැහැල්ලු කොට දැක්වීමක් නොවේ ද?

2) එසේ ලිංගික අපයෝජනයන් සැහැල්ලු කොට දැක්වීම ඔස්සේ, එවැනි අපරාධ සමාජය තුළ සාමාන්‍යකරණය වීමට රුකුලක් නොලැබෙන්නේ ද?

ලිංගික අපයෝජනයන් සැහැල්ලු කොට නොදක්වමු!

